**පසු පිටුවෙන් (අදිසි)**

පල්ලියටත් යන්නට ඇත. කිසිදු කිලුටක් සිතේ ගාවා නොගෙන කිසිදු බේධයකින් තොරව එක සිතින් සියලු සත්වයනට මෙත් වඩන්නට පොඩි හාමුදුරුවන්ට හැකි ය.
රණසිංහ ගේ ප්‍රාඩෝව පන්සල් බිමට ඇතුල් වන්නේ පොඩි හාමුදුරුවන් ආවාසයට යන්නට හැරෙන විටම ය. පිම්මේ ආ වාහනය ආවාසය ඉදිරියේ නවතියි.

"ලොකු හාමුදරුවන් වඩම්මන්න ආවෙ අපේ හාමුදුරුවනේ.." පොඩි හාමුදරුවන් දකින අජිත් කියයි.

"එහෙමද..? යං ඇතුළට.." පොඩි හාමුදුරුවන් පසු පසින් අජිත් ආවාසයට ඇතුල් වෙයි.

ලොකු හාමුදුරුවෝ දිගඇරගත් පුස්කොල පොතක් මහත් ඕනෑ කමකින් කියවමින් සිටිති. අකුරු වඩා පැහැදිළිව කියවා ගැනීම සඳහා ළඟකදී සිට උන්වහන්සේ ලොකු කර බලන කණ්නාඩියක් ද උපකාරයට ගනිති.

"අවසරයි අපේ හාමුදුරුවනේ..." අජිත් දණ නමා වඳියි.
ලොකු හාමුදරුවෝ පුස්කොල පොතත් කණ්නාඩියත් පසෙක තබා අජිත් දෙස බලයි.

"මේ ළමයනෙ.. මට එක පාරටම අඳුනගන්න බැරි වුණා.."

"එහෙමයි අපේ හාමුදුරුවනේ.. වාහනේ නං ලෑස්තියි.."

"වාහනේ...?" ලොකු හාමුදරුවෝ අජිත් දෙස බලන්නේ රැළි කරගත් නළලින් යුතුව ය. "..මොන වාහනයක් ද දරුවො...?"
"ඇයි අපේ හාමුදරුවනේ රැස්වීමට යන්ඩ වාහනේ.."

"රැස්වීමට..? මොන රැස්වීමටද..?"

"අදනෙ රණසිංහ මහත්තයගෙ අන්තිම රැස්වීම... රණසිංහ මහත්තය තමයි කිව්වෙ ඔබ වහන්සෙට වඩින්න වාහනේ යවන්ඩයි කියල .."

"මං හිතන්නෙ රණසිංහ මහත්තයට වැරදීමක් වෙලා කියලයි.. දේශපාලන රැස්වීමකට මං කවදාකවත් වඩින්නෙ නැති වග උන්නැහේ දැනගන්න එපායැ.." ලොකු හාමුදුරුවෝ සන්සුන් ලෙස බුලත් වට්ටිය අතට ගනිති . බුලත් කොලයක් ගෙන ඒ මත සීරුවෙන් හුණු ස්වල්පයක් තවරා මුව තුළට ඔබා ගනිති.

"රණසිංහ මහත්තයා කිව්වෙ ඔබ වහන්සෙ පොරොන්දු වුනා කියලනෙ.."

ලොකු හාමුදුරුවෝ පුටුව අසළින් බිම තිබූ පඩික්කමට කෙළ පහරක් විද අජිත් දෙස හිස ඔසවා බලති.

"පොරොන්දුවක් වුණා නං ඒක කරන්ඩ වෙනවා.. රණසිංහ උන්නැහේ දවසක් ඇවිත් ඔන්න ඔය රැස්වීමක් ගැන යමක් කියනවා නං මතකයි.. එයාම කිව්වා.. එයාම ස්තිර කර ගන්න ඇති මං හිතන්නෙ.. මං නං දරුවෝ කට ඇරලා එක වචනයක පොරොන්දුවක් දීලා නැහැ.. පැවිද්දෙක් හැටියට දේශපාලන වේදිකාවකට නගින්ඩ මගේ කවදාවත් අදහසක් නැහැ.. ඒ ප්‍රතිපත්තිය රණසිංහ මහත්තය නෙවෙයි වෙන මොන ලොක්ක වෙනුවෙන් වත් මං කඩ කරන්නෙ නැහැ දරුවො.. මං බුද්ධ පුත්‍රයෙක්.. ඒ නිසා නෙ දැං මේ දරුවා ආව ගමන් මට වැන්දෙ... එහෙව් මං ගිහියන්නෙ මට්ටමට වැටෙයි කියලා කවුරු හරි හිතනවා නං ඒක ලොකු වැරදීමක්.."

අජිත් අසරණ ලෙස පොඩි හාමුදුරුවන් දෙස බලයි. උන්වහන්සේගේ මුහුණේ ඇඳී ඇති නිවුණ පෙණුම අජිත්ට ප්‍රහේළිකාවකි.

"බලන්ඩකො පොඩි හාමුදුරුවනේ.." අජිත් කියන්නේ පොඩි හාමුදුරුවන්ගෙන් යම් සහයක් ලබාගනු පිනිස ය. "... ඔබ වහන්සෙවත් මේක පොඩ්ඩක් අපේ ලොකු හාමුදුරුවන්ට තේරුම් කරලා කිව්වනං.."

"ලොකු හාමුදුරුවො කිව්ව දේවල් මට නං පැහැදිලිව තේරුණා අජිත්.. මං හිතන්නෙ අජිත් මහත්තයාටත් තේරුම් ගන්ඩ අපහසුවක් වෙන එකක් නැහැ.. බොහොම සරළ කාරණයක් නෙව කිව්වෙ."

"අපේ හාමුදුරුවනේ.. දැං මේක ලොකු ප්‍රශ්නයක් වෙනවනේ.."

"කාටද දරුවො...? මට ද..? රණසිංහ මහත්තයට ද..?" ලොකු හාමුදරුවෝ තවත් පුවක් කැබැල්ලක් මුව තුළට ඔබා ගනිති.
"...මට නං දරුවො මේ ලෝකෙ තියෙන්නෙ එක ප්‍රශ්නයයි.. ධර්මය අවබෝධ කර ගැනීම යි ඒ ධර්මයේ පිහිටලා ජීවත් වීමයි අනිත් අයට ඒ මග පෙන්වා දීමයි.. ඒක මට විසඳ ගත්තැහැකි.. රණසිංහ මහත්තයගෙ ප්‍රශ්න විසඳගන්න එක උන්නැහේටම බාරයි.. ඕනෑ නම් අවවාදයක් අනුශාසනාවක් නං කරන්නඩ පුලුවං මට... කොහොමත් බුද්ධ පුත්‍රයන් වුණ අපෙන් වෙන්න ඕනෙ ගිහියන්ට ඉහළින් ඉඳන් අවවාද අනුසාසනා කරන එකනෙ.."

00000000000

අසා සිටින්නන්ට එපා නොවන ජයසුමන හිටපු ඇමතිතුමා ගේ ලුණු ඇඹුල් සහිත වේගවත් කතාව ඉක්මණින් අවසන් වන පාටක් නැත. ඔහුගේ දෙපිට කැපෙන අසැබි යෙදුම් අසා සිටින්නන් කල්මත් කර ඇති බවක් පෙනෙයි. වරින්වර නැගෙන අත්පොළසන් හඬ ආරම්භ වන්නේ වේදිකාවට දකුණු පසින් වූ තැනකිනි. එතැන සිටින්නේ අජිත් විසින් කල් ඇතිව රඳවනු ලැබූ හිතවතුන් පිරිසකි. එතැනින් අවශ්‍ය වේලාවලදී ආරම්භ වන අත්පොළසම ජන ගංගාවේ ඈත කෙළවර දක්වාම බෝවෙන රෝගයක් සේ විහිදී යන්නේ අපූරුවටය. මොහොතක් නිහඬවී අත්පොළසමට ඉඩ දෙන කථිකයා නැවත සිය කතාව ආරම්භ කරන්නේ ඒ ප්‍රතිචාරය විසින් සිතේ ඇති කරන ලද තෘප්තියේ ශක්තියද ලබා ගනිමින් ය.

වේදිකාව ඉදිරියේ රැස්ව සිටිනා ජන ගංගාව දෙස මහත් ආශ්වාදයකින් බලා සිටින රණසිංහ ගේ මුහුණ හදිසියේ ආ දුරකතන ඇමතුමත් සමගින් අඳුරු වී යනු ඔහුට යාබද අසුණේ වාඩි වී සිටින අයෝමා දකියි.

"ඇයි...?" අයෝමා අසයි.

"අජිත් ගෙන්... ලොකු හාමුදුරුවො එන්නෙ නැහැ කිව්වලු.." රණසිංහ කෝපයෙන් වෙවුළන්නේ යයි අයෝමාට සිතෙයි.

"කලබල වෙන්න එපා... හිනා වෙලා ඉන්ඩ.. පත්තරකාරයො පින්තූර ගන්නවා"

අයෝමා මඳක් කල්පනාවට වැටෙයි. ලොකු හාමුදරුවන්ගේ සම්ප්‍රාප්තියත් සමගින් මෙහි රඟ දැක්වීමට කල් තබා සූදානම් කර තිබූ ජවනිකාව වහා වෙනස් කළ යුතු ය. පෙර සූදානම වූයේ උන්වහන්සේ වේදිකාට වඩිත්ම රණසිංහ ඉදිරියට ගොස් දෙපා නමස්කාර කර උන්වහන්සේ පිළිගන්නටත් ඒ සමගින් වේදිකාවේ සිටින සියල්ලන් නැගී සිටින්නටත් බලා සිටිනා ජනතාව අතරින් මහා ප්‍රීති ඝෝෂාවක් අති කරන්නටත් ය. අවසන් රැස්වීමට ලොකු හාමුදුරුවන් වඩින්නේය යන පුවත කටින් කට ප්‍රචාරය කර හරින්නට පසුගිය සති කීපය තිස්සේම දැරූ මහත් වූ වෑයම අපතේ යන්නට ඉඩ හැරීම අපරාධයකි.

"මොකද කරන්නෙ අපි දැන්..?"
අයෝමා නිහඬවම කොල කැබැල්ලක යමක් සටහන් කරයි. එය රණසිංහ අත තබයි.

"ලොකු හාමුදුරුවො එව්ව නිවේදනය.. අසනීප නිසා වඩින්න බැරි නමුත් රණසිංහ මහතාගෙ " ජයග්‍රණය අපේක්ෂාවෙන් සුබ පතන බව දන්නලා එව්ව නිවේදනය.. මේ නිවේදනය දෙතුන් වතාවක් රස කරලා කියවන්ඩ කියලා අර මයික් එකේ එල්ලිලා ඉන්න ජයසුමන මහත්තයටයි එනවුන්ස් කරන මල්ලිටයි කියන්නඩ.."
"එහෙම බොරුවක් කරන එක හොඳද..?"

"මෙච්චර කල් කළේ ඇත්තම දේවල්ද..? බොරුවට බබෙක් වගේ පෙන්නන්ඩ හදන්නැතුව ඉක්මණට මේක කරන්ඩ රණසිංහ අයියා... කවුරුත් ගිහිල්ලා ඕක ලොකු හාමුදුරුවන්ගෙන් අහන්නෙ නැහැ.. ඇහුවත් අපට කමකුත් නැහැ.."

*මීළඟ කළාපයට*




